# සිංහල හටන් කාව්‍යයේ ප්‍රභවය හා විකාශනය

**- ආධුනික කථිකාචාර්ය බෝලියද්දේ ධම්මකුසල හිමි**

## හැඳින්වීම

සිංහල කාව්‍ය සම්ප්‍රදය පුරාතන යුගයේ සිට පැවත එන්නකි. ක්‍රි.පූ. යුගයට අයත් පද්‍යයෙන් ලියන ලදැයි සැලකෙන කොස්ගම කන්ද, කිරින්ද, තිස්සමහාරාම, දෙමැදඹය[1] ආදී ප්‍රදේශවලින් හමු වූ සෙල් ලිපි මඟින් මෙන්ම ක්‍රි. ව. 700 - 1000 අතර කාලයේ ලියවුණු සීගිරි ගී මඟින් ද එය සනාථ වෙයි. අනුරාධපුර යුගයෙන් ආරම්භ වූ සම්භාව්‍ය සිංහල පද්‍ය සාහිත්‍යය කාලානුරූපී ව වෙනස්කම්වලට භාජනය වෙමින් කවියේ රුව ගුණ රැක ගනිමින් ඉතා දීර්ඝ කාලයක් පැවතුණි.

සිංහල කවියේ සිදු වූ වෙනස්වීම් පිළිබඳ අධ්‍යනයේ දී කෝට්ටේ යුගය වඩාත් වැදගත් වෙයි. කෝට්ටේ යුගයේ දී සිංහල කවියේ වස්තු විෂය පුළුල් පරාසයක විහි දී යන බව අධ්‍යයනය කළ හැකිය. එහි ප්‍රතිඵලයක් ලෙස කෝට්ටේ යුගයෙන් අනතුරුව සිංහල කාව්‍ය සාහිත්‍යයට හටන් කවි නම් වූ අභිනව පද්‍යාංශයක් එක් වෙයි. ප්‍රථම සිංහල හටන් කාව්‍ය ලෙස සැලකෙන්නේ කුස්තන්තීනු හටනයි.[2] සිංහල පද්‍ය සාහිත්‍ය අධ්‍යයනයේ දී විශිෂ්ට කාල පරිච්ඡේදයක් වූ කෝට්ටේ සාහිත්‍යයත් පුනරුත්ථාපන යුගයක් වූ මහනුවර සාහිත්‍යයත් ගළපන පුරුක ලෙස කුස්තන්තීනු හටන් කාව්‍ය සිංහල පද්‍ය සාහිත්‍ය වංශයේ අවිච්ඡින්න සන්තතිය රැක ගත් කෘතිය ලෙස විද්වත් අගයීමට ලක් වී ඇත.[3]

හටනක් විග්‍රහ කරන මුල්ම කෘතිය කුස්තන්තීනු හටන වුවත් හටන් සහ රජුන්ගේ වීර වික්‍රමාන්විත ක්‍රියා පිළිබඳ පද්‍යයෙන් වර්ණා කිරීම ඊට පෙරසිට පැවති බවට බොහෝ සාධක හමු වෙයි. ඒ අනුව නව සාහිත්‍ය අංගයක් ලෙස සිංහල පද්‍ය සාහිත්‍ය වංශයට කෝට්ටේ යුගයෙන් පසු එකතු වූ හටන් කාව්‍යයේ ආරම්භය හා විකාශනය පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම ලිපියේ මූලික අරමුණ වෙයි.

## ප්‍රවේශය

කෝට්ටේ යුගයෙන් පසුව නව සාහිත්‍යාංගයක් ලෙස සිංහල පද්‍ය සාහිත්‍යාවලියට එක්වන ''හටන් කාව්‍ය'' සිංහල ප්‍රශස්ති කාව්‍යයන්හි අන්තර්ගත ලක්ෂණ ද යොදගනිමින් වැඩි දියුණු වූ නව පද්‍ය සාහිත්‍ය ප්‍රවර්ගයක් බව පෙනේ. ප්‍රශස්ති කාව්‍යයන්හි වීරයා සඳහා යෙදෙන සාමාන්‍ය ප්‍රශස්ති වර්ණනාවලට අතිරේක ව ඔහු ජයගත් හටනක් ඉමහත් අභිරුචියෙන් වර්ණනා කිරීම හටන් කාව්‍ය මගින් සිදුවූ බව ඇතැම් විද්වතුන්ගේ මතයයි.[4] එබැවින් ප්‍රශස්ති කාව්‍ය හා හටන් කාව්‍ය සිංහල පද්‍ය සාහිත්‍යයෙහි විද්‍යමාන සාහිත්‍ය ප්‍රවර්ග දෙකක් ලෙස හඳුනා ගැනීම වඩාත් සුදුසුය. ''හටන්'' නමින් හැඳින්වෙන පද්‍ය ප්‍රබන්ධයන්හි ප්‍රශස්ති ලක්ෂණ විද්‍යමාන වුවත් සාමාන්‍ය ප්‍රශස්තියකට වඩා හටන් කාව්‍යයන්හි දක්නට ඇති විශේෂ ලක්ෂණ කීපයක් අධ්‍යයනය කළ හැකිය. හටන් යන නාමයෙන් හැඟෙන පරිදි හටන් කාව්‍යයකට වස්තු විෂය වන්නේ යුද්ධයක් හෝ යුද්ධ කීපයකි. මෙහි දී බිහිසුණු සටනකින් කාව්‍ය නායකයා ජයග්‍රහණය කරයි. එම ජයග්‍රහණය මූලික කර ගනිමින් ඔහුගේ තේජස හා බල පරාක්‍රමය පිළිබඳ වර්ණනයක් හටන් කාව්‍යයෙන් සිදු කෙරෙයි.[5] සිංහල හටන් කාව්‍යයේ ප්‍රභවය පිළිබඳව විමසා බැලීමේ දී පැහැදිලි වී යන්නේ එය සීතාවක අවධියේ දී සිදුවූ බවයි. වෙනම කාව්‍ය ප්‍රවර්ගයක් වශයෙන් හටන් කාව්‍යයක් සිංහල සාහිත්‍යයට එක් වන්නේ සීතාවක අවධියේ වුවත් යුද හෙවත් හටන් පිළිබඳ වර්ණනය ඊට පෙර සිට පැවති බැව් සනාත කිරීමට සිංහල ගද්‍ය පද්‍ය කෘතීන්, සෙල්ලිපි, සැහැලි



ස්වරූපයේ කාව්‍ය ආදී වූ විද්‍යමාන සාහිත්‍ය මූලාශ්‍රයන් ඇසුරු කරගත හැකිය. ප්‍රශස්ති, මහා කාව්‍ය, සංදේශ කාව්‍ය හා ඓතිහාසික ජන කාව්‍ය (Historical Ballad), විරුද, ස්තෝත්‍ර ආදී සාහිත්‍ය ග්‍රන්ථයන්හි යුද වැනුමක් හෝ යුද තොරතුරක් ඇතුළත් කර ඇත්තේ මහත් අභිරුචියෙනි.

හටන් තොරතුරු ලබා ගැනීමේ විද්‍යමාන මූලාශ්‍රයක් ලෙස සෙල්ලිපිවලින් ද යම් යම් තොරතුරු අධ්‍යයනය කළ හැකිය. සිංහල - දෙමළ යුද්ධයක් පිළිබඳ තොරතුරු "කොටගම" සෙල්ලිපියේ සඳහන් වේ. සෙල්ලිපි තුළ පවා හටන් තොරතුරු ඇතුළත්වීමෙන් ප්‍රත්‍යක්ෂ වන්නේ "හටන" ජන ජීවිතය කෙරෙහි කොතරම් සමීප මෙන්ම බලපෑම් කළ අංගයක් වූයේ ද යන්නයි.

මහාවංශය, චූලවංශය ආදී වංශකතාවල රජවරුන්ගේ ශූර වීර කම් හා යුද වර්ණනා ඇතුළත් වී ඇත. ගෛගර් පඬිතුමා මහා වංශය හඳුන්වා ඇත්තේ වීර කාව්‍යයක් ලෙසයි.[6] මහාවංශයේ දුටුගැමුණු රජු වීරත්වයෙන් වර්ණනා කෙරෙන අතර චූලවංශයේ ප්‍රථම භාගයේ වීර කාව්‍ය නායකයා වශයෙන් ගෙන ඇත්තේ පළමු පරාක්‍රමබාහු රජතුමාය. එහි දෙවන කොටසේ පණ්ඩිත පරාක්‍රමබාහු රජතුමාත්, තෙවැන්නේ කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාත් වීරත්වයෙන් වර්ණනා කර තිබේ. එබැවින් මහා වංශය හා චූලවංශය තුළ වීරකාව්‍ය ලක්ෂණ අන්තර්ගත වී ඇති බව පෙනී යයි.[7]

දණ්ඩීන්ගේ "කාව්‍යාදර්ශය" ගුරුකොට ගෙන ක්‍රි. ව. 9 වෙනි 10 වෙන සියවස්වල ලියැවිණැයි සැලකෙන 'සියබස්ලකර' පද්‍ය බන්ධනය සඳහා කවීන්ට උපදෙස් සපයන අතර, සියබස්ලකරින් අනුදක්නා ලද මඟ පෙන්වීම නිසා පසුකාලීන කවියන්ගේ ගමන් මඟ ද ආලෝකවත් විය. පූර්වයෙහි සංක්ෂේපයෙන් ලියන ලද කෘතීන් පිළිබඳව හා සංස්කෘත භාෂාව නොදන්නවුන් සඳහා ලියවුණු මේ කෘතියෙන් මහා කාව්‍ය ලක්ෂණ විස්තර කිරීමටද කතුවරයා අමතක නොකරයි. එහි දී කතුවරයා යුද වැනුමක අවශ්‍යතාව පළ කර ඇත්තේ මෙසේය.

''පෙළැඹුම් විවා ගැනුම් - කුමරුනුපැත් වැඩුමෙන්
මතුරු දූ දූ ගමන් යුද - උළාර නා උදෙනි දූ"[8]

යුද්ධයක් සහ උදාර වූ නායකයාගේ ජයග්‍රහණයක් පිළිබඳ වර්ණනා මහාකාව්‍යයක අඩංගු විය යුතු බව මේ අනුව පැහැදිලි වේ. ඒ මඟ ඔස්සේ ගමන් ගත් පසුකාලීන සිංහල පද්‍ය රචකයින් මහාකාව්‍යයන් සඳහා පමණක් නොව, කවිසමයානුගතවීම සඳහා සෑම නිර්මාණයක් තුළටම යුද වැනුමක් ඈදා ගත්තේ මහත් අභිරුචියෙනි.

පොළොන්නරු යුගයේ දී ලියවුණු ප්‍රථම ගී කාව්‍ය දෙක ලෙස පිළිගැනෙන්නේ මුවදෙව්දාවත හා සසදාවත යි. මේ කාව්‍යයන්හි බෝධිසත්ව චරිතය තුළ පවා රණශූරත්වය ඉස්මතුකොට දක්වූයේ සංස්කෘත කාව්‍යයන්ගේ බලපෑම නිසාම නොව, සිංහලයන්ගේ රණකාමිත්වය ඉස්මතු කිරීම සඳහා යැයි අනුමාන කළ හැකිය.

''නිරිඳු සඳ ගිරිඳු බුජ - කුළු ලකුළු කගසී
හී රුපු ඇත් මුදුනේ - දළ දජ මුල කබල ගත්''

සිංහයා මහා කන්දක් මුදුනේ සිට ඇතාගේ හිසට පැන හිස පළා මොළය කන්නා සේ මේ රජතුමා සතුරන් අතරට පැන එක කඩු පහරින් ඔවුන්ගේ බලය සින්දේය.

"කෝ ගිනි එනිරිඳු - විපක් අසිපින් දුලු
නිවී ඔවුන් සෙපියන් - නුවන් කෙළෙ නැස දර තෝ"[9]

නරේන්ද්‍රයාට (මඛාදේව රජතුමාට) විපක්ෂවූවන්ගේ කඩු කරණකොට ගෙන දල්වුණ කෝපය නැමති ගින්න ඔවුන්ගේ බිරියන්ගේ ඇස් කෙළවරින් වැගිරෙන්නා වූ කඳුළු ධාරා නැමති ජලය තෙමා නිවාලුයේ ය. බෝධිසත්ව චරිතයක් වූ මඛාදේව රජතුමා තුළ පවා මෙබඳු රණශූරත්වයක් ඉස්මතු කොට දැක්වීමෙන් පැහැදිලි වන්නේ යුද්ධය හෙවත් හටන් සිංහල සාහිත්‍යයට නැතුවම බැරි අංගයක් වූ බවයි.

13 වන සියවසේ දඹදෙණි අවධියේ රචිත යැයි පිළිගැනෙන 'සිදත් සඟරාව' ව්‍යාකරණ ග්‍රන්ථයක් සේම පද්‍ය බන්ධනය සඳහා



උපදෙස් සැපයූ ග්‍රන්ථයක් බවද ප්‍රකාශ කිරීම නිවැරදිය. මේ ග්‍රන්ථයේද හටන් තොරතුරුවල ජායාවක් වැටී ඇති බව පෙනෙයි.

"බුජ නම් මැව්ණි දෙන්නට ද කොටන්නට ද?"[10]

''බාහුව දනයට ද ශස්ත්‍ර බණ්ඩනයට ද නිර්මිත වී'' යනුවෙන්, අත මැවී තිබෙන්නේ පරිත්‍යාගයට හා සතුරන් නැසීමට බව දක්වයි. යුද්ධය ආපදාවක් වූවත් යුද්ධයට වැඳ සතුරන් වනසා ගනු ලබන ජයග්‍රහණය මහත්ම වූත් ශ්‍රේෂ්ඨ වූත් සම්පත්තියක් බව මේ තුළින් ධ්වනිත කෙරෙයි. එමෙන්ම සිංහල - කේළර යුද්ධයක තොරතුරු ද සිදත් සඟරාවේ හමුවෙයි.

"සඳ වනසිඳුකිය කුඹුයොන නම සතරා
කිවිසෙවෙන තොද වැල නී යළ නො ගොරා
අරුණුකි හෙනි වී කෙරළන් ලැබැ හුරිරා
පැටිවනෙදෙසැ යුද පතිරජදිය ඉසුරා"[11]

පතිරාජ දේවයන්ගේ රණශූරත්වය මින් ප්‍රකට කරයි. ඔවුන් විසින් ගංගාවක ජලය රක්ත වර්ණ වන තරමට සතුරු රුධිරය වගුරවා හැරිමට සලස්වා ඇත.

සම්භාව්‍ය සිංහල පද්‍ය සාහිත්‍යයේ මහා කාව්‍යයන්ට හිමි වනුයේ සුවිශේෂ ස්ථානයකි. සංස්කෘත කවි සමයානුගත මේ සාහිත්‍යාංග සියබස්ලකරින් අනු දක්නා ලැබීමෙන් එම කවිමඟ ඔස්සේ මහාකාව්‍ය රචනා කරන්නට උත්හස ගත් කාව්‍ය රචකයන් අතර දෙවන පැරකුම්බා නිරිඳු සිය අභිමතාර්ථ සාධනයට ඉමහත් සමාර්ථ්‍යයක් දැක්වූ රචකයෙකි. සිංහල සාහිත්‍යයේ මුදුන් මල් කඩක් බඳු කව්සිළුමිණ සඳහන් යුද වැනුම කුඩා හටන් කවකට වුවද ප්‍රමාණවත්ය. මෙහි සඳහන් කුස රජු සත්රජුන්ගේ එඩි මැඩීමට යන අවස්ථාවේ කතුවරයා යුද වැනුමකට අවස්ථාව සකසා ගනියි.

"දවත යෝ බළහු - ගිජිඳුන් බැඳ කුරු දෙබේ
සමහර නසාලු කවද - සිය සලක් කොළෝ කොටැ''[12]

යුද්ධ භටයන් ඇතුන්ගේ ශරීරයන් දෙබෑ කොට දුවන කල්හි සමහර භටයෝ නසන ලද සියක් ගණන් කවන්ධ රූපයන් (හිස රහිත ශරීරයන්) කෙරෙහි කිසිදු සැලකිල්ලක් නොකළේය.

"හයත වට කැරැසැවි - සරොස්නිසේ රිපුබළ
කපැත්වැ හිස තමා සැක - දැනවී දෙසෙන් හී බළන්"[13]

සතුරු භටයෙක් කෝපයෙන් දුන්න ඇඳගෙන වෙඩිට කරකැවිණි. එවිට දෙසේනාවෙහිම භටයෝ තම තමන්ගේ හිස් කැපෙන කලක් මෙන් බියට පත් වූහ. ඒ ඊට කොයි කොයි මොහොතේ සිට ඉලක්ක වේ දැයි නොදත් බැවිණි.

කෝට්ටේ යුගය සිංහල පද්‍ය සාහිත්‍යයේ ස්වර්ණමය යුගය මෙන්ම පරිවර්තන අවධිය ලෙස ද සැලකිය හැකිය. සිංහල සාහිත්‍යයේ කැපී පෙනෙන වෙනස්කම් රැසක් ම මේ අවධියේ දී සිදුවූ බව පෙනෙයි. සියබස්ලකරින් හෙළි කළ කාව්‍ය වස්තු විෂය (පෙදෙන් බුදු සිරිතැ) ලෞකික අංශයට නැඹුරු විය. මෙතෙක් පැවිද්දන් අත තිබූ සාහිත්‍ය කරණය ගිහියන් අතට පත් විය. ගම්පොළ හා කෝට්ටේ යුගයන්හි රචිත සන්දේශ කාව්‍යයන් හා පැරකුම්බා සිරිත විමර්ශනය කරන විට මෙම පරිවර්තනීය ලක්‍ෂණ අවබෝධ කරගත හැකිය.

ගම්පොළ යුගයේ දී රචිත මයුර හා තිසර සන්දේශයන්හි මෙන්ම, කෝට්ටේ යුගයේ දී ලියැවුණු පරෙවි,සැළලිහිණි, ගිරා, හංස හා කෝකිල සන්දේශයන්හි ද යුද තොරතුරු ඇතුළත් විය. සිංහල - මළවර යුද්ධයක තොරතුරු ගිරා සන්දේශයෙහි සඳහන් වේ. එහි එන "අම්බලමේ කතා" පැරකුම් රජුගේ රණශූරත්වය සහ වීර වික්‍රමාන්විත ගුණයන් පිළිබඳව ගැයෙන ප්‍රශස්ති කාව්‍යක් බඳුය.

"මෙනර පවරයා
හළ නැව බඬ පුරායා
අත උදුරැයා
ගතැ' යි රායන් මලවරායා"



"දඹදිවැ සොළී රට
අදිවි රාම පටනට
මහ සෙනඟ යුදයට
යවා මහ නැව් පිටින් එක විට"[14]

පරාක්‍රම බාහු රජගේ වීරවික්‍රමාන්විත බව හා බල පරාක්‍රමය හා ප්‍රතාපවත් බව ගිරා සන්දේශ කරුවාගේ වර්ණනයට ලක් වෙයි.

''මෙ ර ද ගුණෙන් සව් සත සිත් සැනැහැවිය
නි බ ඳ දෙනෙන් සිතුමිණෙකැ යි ඇඳූහැවිය
නොමඳ බෙලෙන් පැ ලොව බලදෙව් හැවිය
දූ හ ද රදුන් කග දල දරිනි නැහැවිය''

''සොර කම් කැරැ රැගෙනැ වෙන වෙන වෙස් රුදුරු
සූ රු කම් කළපොරණ දියබඳහු තරතුරු
පැ රැ කුම් පැ නොයෙක් එක වෙසැ සිටැ සොඳුරු
පැ රැ කුම් රජුට සරි යැ යි පවසති කවුරු''[15]

මෙයින් පැරකුම්බා රජතුමා විෂ්ණු දෙවියාත් අබිබවා සිටි බව පැවසේ. එහි ඇත්තේ විරිදු කවක ලක්ෂණයි

හටන් කාව්‍යන්හි ආරම්භක මං සලකුණු හඳුනා ගත හැකි තවත් කාව්‍යක් වන්නේ පැරකුම්බා සිරිතයි. සාහිත්‍යමය අගයෙන් යුත් ප්‍රශස්ති හා හටන් කාව්‍යයන් අතර පැරණිතම කෘතිය කෝට්ටේ යුගයේ රචිත පැරකුම්බා සිරිත බව විද්වතුන්ගේ අදහසයි.[16] මෙම කෘතිය හටන් කාව්‍යයකට වඩා ප්‍රශස්ති කාව්‍යයක් සේ සැලකීම වඩාත් සුදුසුය. මෙහි රජුගේ රණශූරත්වය සඳහන් වනු විනා විශේෂ හටනක් ගැන සඳහන් වී නොමැත. ඇත්තේ ප්‍රශස්ති පමණි.[17] කෙසේ වුවත් පැරකුම්බා සිරිත පසුකාලීන හටන් කාව්‍යයන්හි ප්‍රභවය කෙරෙහි ඉමහත් බලපෑමක් කළ කෘතියකි. සිංහල සාහිත්‍යයෙහි යුද වැණුම් සහ නායකයන්ගේ රණශූරත්වය පිළිබඳ වර්ණනයන් ක්‍රමයෙන් වර්ධනය වී නිර්මාණය වූ හටන් කාව්‍යයන්ගේ බීජ අවස්ථාවක් ලෙස පැරකුම්බා සිරිත හැඳින්වීමට පුළුවන. පැරකුම්බා සිරිතේ

ආභාසය හටන් කවීන් නිරතුරුවම ලබා ගත් බව පෙනේ. එනිසා මෙම කාව්‍ය හටන් කාව්‍ය පිරික්සීමේ දී පෙනේ.

පැරකුම්බා සිරිතේ දැක්වෙන වර්ණනයන්ට අනුරූප වර්ණනයන් බෙහෝ හටන් කාව්‍යයන්හි දැකිය හැකිය. පැරකුම්බා රජුගේ රණශූරත්වය පිළිබඳ කෙරෙන වර්ණනය පසුකාලීන හටන් කාව්‍ය කීපයකටම බලපෑ වර්ණයකි.

"පැහැ දි සරම්බා රැදි      මනරම්බා
තුනුසිරි රම්බා පති      පිළිවිම්බා
රුපු රජ රම්බා රන මත      කුම්බා
දින පැරකුම්බා හිමි      තෙවිකුම්බා"

"අණ තද මෙ නිරිඳු වැනි නොම      කාළම
ගුණ සරු අකරණ වන් ගුන      කාළම
බැණ නැඟි නද අසමින් රන්      කාළම
රන දෙරණත නොලැලෙද්දෝ      කාළම"[18]

විල්ගම්මුල හිමි ලියූ සඳකිඳුරු දා කාව්‍ය ද හටන් කාව්‍යයන්හි ප්‍රභවයට ප්‍රමාණවත් පිටුබලයක් ලබා දී ඇති බව කිව හැකිය. සඳකිඳුරු දා කවෙහි 93 වන පද්‍යයෙහි සිට 143 වන පද්‍ය දක්වා පද්‍යයන් තුළ හටන් විස්තර ඇතුළත් කොට තිබේ.

යුද බිමෙහි අවි ගැටෙන හඬ පවා දැනෙන අන්දමින් වාග්මාලාව හැසිර වීමට කතුවරයා දක්වා ඇත්තේ අපූර්ව ප්‍රතිභාවකි.

"ගනු අනු බඳු      කොටව
කර මර බලා      නොසිටිව
අවි කැල ඇඟ      පටව
කියා සෙනඟක් සිටිති      පෙරටුව"

"මර සෙනඟ හමු      වත
සුර සෙනඟ බිය වැද      සිත
පුදවත් දමා      ඇත
ගියේ ඉස් ලූ ලූ අතින්      අත''



සටන කෙළවර වසවත් මාරයා බුදුන් හමුවේ පරාජය වූ අන්දම

"බෝ සතුට ජය      විය
වස වතු පරාජය      විය
මොක් පුරට ජය      විය
මෙතෙම තෙදියම එක ද ජය      විය"[19]

හටන් කාව්‍ය රචනා වීමට පෙර සැහැලි ස්වරූපයෙන් ලියවුණු හටන් පිළිබඳ තොරතුරු හමු වෙයි. ජනකවි ආරෙන් පැබැඳුණු මේ හටන් සැහැලිවල රණවික්‍රමය, ජාතිකානුරාගය මෙන්ම සියුම් උපහාසයක් ද ගැබ්ව තිබේ.

"නිම්නැති කොට බැඳලා රුවටිච්      චී
ගන්නෝ රුවේ කොටුවට ඇසිරිච්      චී
වෙන්නොව එකිනෙක පෙළටසැදිච්      චී
ගොන් ගෙරි කැරිහිලි එදා පලච්      චී"[20]

බොහෝ දුරට මුඛ පරම්පරා ගතව පැවත ආ මේ සැහැලි ජාතිය පරාධීන වීමත් සමඟ අභාවයට ගිය බව පෙනෙයි. එහෙත් සමහර සැහැලි අද දක්වාත් පවත්වා ගෙන එන බව පෙනෙයි.

සම්භාව්‍ය සිංහල පද්‍ය සාහිත්‍යයේ පද්‍ය කාව්‍ය රචනාවන් සඳහා නිරන්තරයෙන්ම තේමාව හෙවත් වස්තු විෂය වූයේ කිසියම් ආගමික කතා පුවතකි. කාව්‍යක වස්තු විෂය එබඳු වූ ආගමික පසුබිම තුළ නිර්මාණය කළ යුතු වීම, එකල කවිසමයානුගත සිරිතක් වූ බව ප්‍රකටව පෙනෙන කරුණකි. පද්‍ය බන්ධනයෙහි ලා උපදෙස් සැපයූ සියබස්ලකරේ වස්තු විෂය ආගමික තේමාවක් වියයුතු බව අවධාරණය කර ඇත.

"පෙදෙන් බුදු සිරිත
බසින් වත් සාරිත් ඈ......"[21]

පද්‍යයෙන් නම් බුදු සිරිත ලිවිය යුතුය යන පිළිගැනීමක් අනුරාධපුර යුගයේ සිට ම කවීන් හා අලංකාරිකයන් අතර පැවතිණ.[22] සියබස්ලකරින් අනුදක්නා ලද මේ මඟ ඔස්සේ ගමන්

ගත් පැරණි පද්‍ය කාව්‍ය රචකයින් සිය කාව්‍යයන්හි වස්තු විෂය හෙවත් තේමාව ලෙස බුදුසිරිත තෝරා ගැනීම අප කවීන්ට වඩාත් ප්‍රියමණාප වූ බව පෙනෙයි. පොළොන්නරු යුගයේ දී ලියවුණු මුවදෙව්දවත හා සසදවතටත් දඹදෙණි අවදියේ දී ලියවුණු හෙළයේ මහා කාව්‍යය වූ කව්සිළුමිණටත් වස්තු විෂය වූයේ ආගමික කතා පුවත්ය. පසුකාලීනව කෝට්ටේ යුගයේ ලියවුණු කාව්‍යශේඛරය හා ගුත්තිලය ආදී කාව්‍යයන්ට ද වස්තු විෂය හෙවත් තේමාව වූයේ කිසියම් ආගමික කතා පුවතකි.

මෙසේ සිංහල සාහිත්‍ය වංශය තුළ මෙතෙක් ආ ගමන් මඟ පැහැදිලිවම පරිවර්තනයක් කරා ගමන් ගත්තේ කෝට්ටේ යුගයේ දී බව පෙනෙයි. කෝට්ටේ යුගයේදී සැලකිය යුතු වෙනස්කම් රාශියක් සහිතව සිංහල සාහිත්‍යය නව මඟකට අවතීරණය විය. එය මෙතෙක් සාහිත්‍ය කරණයේ දී පිළිගත් සාම්ප්‍රදායික පිළිගැනීම් ඉක්මවා යාමකි.[23] ආගමික පුවතක් පමණක් තේමා කර ගත් නිර්මාණ වෙනුවට කාව්‍යයේ වස්තු විෂය විවිධ අංශ කරා පෘථුල වීමක් කෝට්ටේ යුගයේ දක්නට ලැබුණි. මෙතෙක් කල් පැවිද්දන් අත රැඳි සාහිත්‍ය කරණයේ වැදගත් කොටසක් ගෘහස්ථ ලේඛකයන් අතට පත්වීම නිසා සිංහල සාහිත්‍යයේ පෙර නොවූ විරූ අමුතු විපර්යාසයක් හටගත් අතර හටන් කාව්‍ය නිර්මාණය වීමට මේ පසුබිම හේතු වූ බව විද්වත් මතයයි.[24]

පද්‍ය බන්ධනයෙහිලා ඇල්මක් දැක් වූ ඕනෑම පුද්ගලයකුට සිය මනාපය පරිදි ඕනෑම වස්තු විෂයක් තෝරාගෙන සාහිත්‍ය කරණයේ නියැලීමට අවස්ථාව උදා වූයේ මින් පසුවයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස විවිධ තේමාවන් ඔස්සේ පද්‍ය නිර්මාණ බිහි විය. සිංහල පද්‍ය සාහිත්‍යයේ නැවුම් ආරක් ගත් තේමාවක් ඔස්සේ ලියවුණු 'පැරකුම්බා සිරිත' පැරකුම් නිරිඳුන්ගේ තොරතුරු හා ඔහුගේ රණශූරත්වය, වීරවික්‍රමාන්විත ගුණ ප්‍රකාශකිරීම උදෙසා පබැඳුණු ප්‍රශස්ති කාව්‍යකි.

සොළොස් වැනි සියවස අගභාගය දක්වා හටන් නමින් දැක්වෙන සාහිත්‍යාංශයක් දක්නට නොලැබේ.[25] සිංහල පද්‍ය සාහිත්‍යයෙහි වස්තු විෂය පුළුල් වීමේ තවත් ප්‍රතිඵලයකි, හටන් කාව්‍ය නැමැති නව සාහිත්‍යාංගය එකතු වීම. හටන් කාව්‍ය ප්‍රථම වරට සිංහල පද්‍ය සාහිත්‍යාවලියට වෙනම පද්‍ය සාහිත්‍ය ප්‍රවර්ගයක් ලෙස එක් වූයේ සීතාවක අවධියේ දී බව පෙනේ. ප්‍රථම හටන් කාව්‍යය ක්‍රි. ව. 1618 - 19 අතර කාලයේ අලගියවන්න මුකවෙටිතුමා විසින් රචනා කරන ලද කුස්තන්තිනු හටන බව බොහෝ දෙනාගේ පිළිගැනීමයි. එහෙත් ඇතැම් විද්වතුන්ගේ මතය වන්නේ ක්‍රි. ව. 1585 රචිත සීතාවක හටන නම් හටන් කාව්‍ය සිංහලයේ ප්‍රථම හටන් කාව්‍ය බවයි.[26] කෙසේ වුවත් ඓතිහාසික යුදධයක් අරභයා ලියැවුණු හටන් කාව්‍ය මගින් රජුගේ රණශූරත්වය හා වීර වික්‍රමාන්විත ගුණ ප්‍රකාශකිරීමක් සිදු වූ අතර එහිදී යුද්ධයට සහභාගී වූ ප්‍රතිවාදීන් ලත් අන්ත පරාජයත් සතුරු සේනාවන්ගේ රුපු එඩි මැඩ රජු ජය ලැබූ අන්දමත් හටන් කවීන් විසින් වර්ණනා කරණු ලැබූයේ මහත් අභිමානයෙන් හා අභිරුචියෙන් යුතුවය.



වචනයේපරිසමාප්ත අර්ථයෙන්ම හටන යනු යුද්ධයකි. එහෙයින් හටන් කවට වස්තු විෂය විය යුත්තේ සැබෑ යුද්ධයක් පිළිබඳ තොරතුරුය. මුල්කාලීනව ඓතිහාසිකව පැවති යුද්ධයක් වස්තු විෂය කරගෙන හටන් කාව්‍ය කීපයකක් ලියැවුණි. කුස්තන්තිනු හටන, මහ හටන, පරංගි හටන, ගන්නෝරු හටන සහ ඉංග්‍රීසි හටන වැනි හටන් කාව්‍ය එබඳු හටන් කාව්‍ය කීපයකි. එහෙත් පසුකාලීනව මේ තත්ත්වය ක්‍රමයෙන් වෙනස්ව ගිය බව පෙනේ. එහිදී පැවති කිසියම් යුද්ධයක් හෙවත් හටනක් අරභයා නොව වෙනත් විවිධ අන්දමේ තේමාවන් මත රචිත පද්‍ය කාව්‍ය හටන් යන නාමයෙන් පද්‍ය සාහිත්‍ය තුළට ප්‍රවිෂ්ටවූ බව අධ්‍යයනය කළ හැකිය. එබඳු හටන් කාව්‍යයන්හි නාම මාත්‍රිකව පමණක් හටන් යන නාමය යොදා ගත් හෙයින් හටනක ඡායාමාත්‍රයකුදු නොමැත බව පෙනේ. එබැවින් සිංහල හටන් කාව්‍යයන්හි හටනක් තේමාව කරගත් කාව්‍ය නිර්මාණ ඇත්තේ සුළු ප්‍රමාණයකි. වස්තු විෂය හෙවත් තේමාව අනුව සිංහල හටන් කාව්‍ය කොටස් කීපයකට වර්ගකොට අධ්‍යයනය කළ හැකිය. එනම්,

01. ඓතිහාසික හටනක් විෂය කරගත් හටන් කාව්‍ය

02. ඓතිහාසික සිදුවීම් විෂය කරගත් හටන් කාව්‍ය

03. සමාජ ප්‍රශ්න විෂය කරගත් හටන් කාව්‍ය

04. පෞද්ගලික ප්‍රශ්න විෂය කරගත් හටන් කාව්‍ය, යනුවෙනි.

**ඓතිහාසික හටනක් විෂය කරගත් හටන් කාව්‍ය**

ආරම්භක හටන් කාව්‍ය තුළ දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණයක් වන්නේ ඓතිහාසිකව සිදුවූ හටනකට මුල්තැන දෙමින් හටන් කාව්‍ය රචනා කිරීමයි. සිංහල පද්‍ය සාහිත්‍යයෙහි එබඳු හටන් කාව්‍ය රාශියකි.

- කුසිතන්තීනු හටන
- මහ හටන I
- මහ හටන II
- පරංගි හටන
- ඉංග්‍රීසි හටන

ක්‍රි ව : 1618 - 1620 අතර කාල පරිච්ඡේදයේ දී ලියැවුණු කුස්තන්තීනු හටන හටනක් වස්තු විෂය කර ගත් පැරණි ම හටන් කාව්‍යය යි. කිතු සමය වැළඳ ගත් අලගියවන්න කුස්තන්තීනු හටන පටන් ගත්තේ දෙවියන් වහන්සේ වැඳ අනතුරුව ක්‍රිස්තුස්වහන්සේට නමස්කාර කරමිනි. ඒ අනුව මෙහි කතුවරයා අලගියවැන්න බව ඇතැම් විද්වතුන් අවධාරණය කරති.[27] පුංචිබණ්ඩාර සන්නස්ගල, බද්දේගම විමලවංශ, ඇස්. ජී. පෙරේරා පියතුමා වැනි විද්වත්හු ද මෙම හටන් කාව්‍ය අලගිය වැන්නගේ බව ප්‍රකාශ කළහ. කුස්තන්තීනු හටනේ වස්තු විෂය හෙවත් තේමාව හැටියට පවතින්නේ කුස්තන්තීනුද සා නැමැති ප්‍රතිකාල් සෙන්පතියා විසින් කුරුවිටරාල (අන්තෝනි බරෙන්තු) නැමැති සිංහල වීරයකු විසින් දියත් කෙරුණු කැරැල්ලක් මැඩ පවත්වා ලබාගත් ජයග්‍රහණය පිළිබඳ තොරතුරුයි. සීතාවක



රාජසිංහ රජුගේ අභාවයෙන් පසු මුළු ලංකාවේ ම බලය සියතට ගැනීමේ බල ලෝභී චේතනාවෙන් පෘතුගීසිහු කටයුතු කළහ. මේ අතර කුරුවිටිරාල හෙවත් අන්තෝනි හරෙන්තු නම් හෙළ වීරයා පෘතුගීසි සමය වැළඳ ගෙන අන්තෝනි බරෙන්තු යැයි නම් ගෙන පෘතුගීසින්ට එරෙහිව සටන් දියත් කළෙන් එය පෘතුගීසින්ගේ මහත් නොසන්සුන් තාවයට හේතු විය. හරෙන්තුගේ ක්‍රියා මැඩලීම හමුවේ තරමක් අඩපණ වූ පෘතුගීසිහු ගෝවට ඒ බව සැලකර සිටියහ. එහි ප්‍රතිඵලයක් ලෙස මෙහි ක්‍රි.ව. 16 දී ලක්දිවට පැමිණි කුස්තන්තීනු ද සා නැමැති ඉංග්‍රීසි සෙම්පතියා අන්තෝනි හරෙන්තුට එරෙහිව සටන් ඇරඹීය. මෙහි විස්තර වන්නේ එම හටනයි.

හරෙන්තු සහ එකල පාලකයා වූ මායාදුන්නේ මැඩීම සඳහා කුස්තන්තීනු ද සා විවිධ ජාතීන්ට අයත් සේනාවන් ගෙන් සමන් විත විශාල හමුදාවක් සමඟ ඉදිරියට ගමන් කොට මායාදුන්නේගේ මැද්දේගම් නුවර මාලිගය ගිනිලූ ආකාරය කතුවරයා විස්තර කර ඇත්තේ භීතියත් සංත්‍රාසයත් දැක්වෙන අයුරිනි.

"සදා යහන් තුළ නිස ගේ
නිදා පියන රජු සිත ගේ
උදාර වූ සැතපෙන ගේ
දදා වැටිණි ලෙස ගිනි ගේ"[28]

සටන අවසානයේ මායාදුන්නේ පලා ගිය නමුත් පෘතුගීසින්ගේ ප්‍රබල සතුරා වූ අනතෝනි හරෙන්තු අල්වා ගැනීමෙන් සටන අවසන් විය. මෙසේ සතුරා මැඩපවත්වමින් කුස්තන්තීනු ද සා කළ සටන හා ඔහුගේ ගුණ වර්ණනා කිරීම මේ කාව්‍ය ලිවීමේ පරමාර්ථය වූ බව පෙනෙයි.

ඓතිහාසික හටනක් වස්තු විෂයකර ගත් 'මහ හටන' දෙවන රාජසිංහ රජුගේ යුද්ධ පිළිබඳ විස්තර කරන බැවින් මෙම ග්‍රන්ථයට රාජසිංහ හටන යනුවෙන් ද නම් කර ඇත. අළුදෙණියේ මොහොට්ටාල විසින් කාව්‍ය රචනා කෙරුණු බව

ජනශ්‍රැතිය අනුව යමින් සිංහල සාහිත්‍ය වංශය කෘතියේ පී. බී. සන්නස්ගල ප්‍රකාශ කරයි.[29] සෙනරත් රජු හා දෙවන රාජසිංහ රජු පෘතුගීසින් සමග කළ සටන් කීපයක් පිළිබඳ තොරතුරු මෙහි ඇතුළත් වෙයි. රන්දෙණිවෙළ හටන සහ ගන්නොරුව හටන නියම හටනක ස්වරූපයෙන් වර්ණනා කර තිබේ.[30] ගන්නොරුව යුද්ධයේ බියකරු තතු භීතියත් සංත්‍රාසයත් දැනෙන අයුරින් පද්‍යයට නැගීමට කවියා දක්වා ඇත්තේ අපූර්ව ප්‍රතිභානයකි. පෘතුගීසින් විසින් සිංහලයන්ට අමානුෂික ලෙස සැලකීම නිසා ඉන් කොපයට පත් සිංහලයන් පෘතුගීසින් වනසා දැමූ හැටි දක්වන්නේ උපහාසය ද මුසු කරමිනි.

"ක ද ලි වනය මෙන් ඇත බිඳ   හරවා
තැඹිලි ගෙඩිසෙ ඔලු සිඳ ගොඩ   කරවා"
"කෙලක් කෝටි මිළලත් උලු ගේ   වල
ම ල ක් සේම ඉඳ ඇඳ ඇතිරිලි   වල
පැලක් විතර නො ලැබී හිඳ ඇතිරිලි   වල
කලක් එපවතින යුද රජසිහ   කළ"[31]

අළුදෙණියේ මොහොට්ටාලගේ මෙම මහ හටන පිළිබඳ ව මෙන් ම ඉතිහාස කරුණු අතින් ද වඩාත් පොහොසත්ය. එයට හේතුව ලෙසින් විද්වතුන් දක්වන්නේ රාජසිංහ රජුට පක්ෂපාතව රන්දෙණියවෙලේ සටනෙහි දී රණබිමට බට ප්‍රභූවරයකු බැවින් ඔහු අත්දකීම් බහුල කෙනෙකු වීම බවයි.[32] නියම ලෙස සටනක් වස්තු විෂක කර ගනිමින් රචිත මහ හටන ප්‍රශස්ති කාව්‍යයක් ලෙස ද අගය කළ හැකිය. එමෙන් ම හටන් කාව්‍ය සාහිත්‍යයේ විශිෂ්ටතම කාව්‍ය ලෙසට මෙම කව්‍යය විද්වතුන්ගේ ඇගයීමට ලක් වෙයි.

මහ හටන නමින් ම හැඳින් වූ දෙවන හටන් කාව්‍යයක් ද රචනා වී ඇත. එම හටන කිරිමැටියාවේ මැතිඳු රචනා කළබව ග්‍රන්ථ අවසානයේ සඳහන් වේ. දෙවන රාජසිංහ රජුගේ රණශූරත්වය හෙළි කළ හටන් කාව්‍ය අතර ඉතා විශාල හටන් කව මෙයයි. මහ හටන ලියන ලද්දේ රාජසිංහ රජු විසින් කරන ලද හටන් පිළිබඳ ව තොරතුරු අන්තර්ගත කරමින් ඔහු පිළිබඳ



ගුණ වර්ණනා කිරීම සඳහාය. දෙවන රාජසිංහ රජු පෘතුගීසින් සමග සටන් කොට ලත් විජයග්‍රහණය වර්ණනා කිරීම සිය කාව්‍ය රචනයේ අභිප්‍රාය බව කතුවරයා ම ප්‍රකාශ කරයි.

"සෙත් කළ තිලොවට සුර රජ   ලෙසිනා
සත් රැක වැජඹුණු රජ සිහ   නරනා
ගත් රජ රුපු බිඳ සිරිලක   තෙදිනා
සිත් ලෙස පවසම් කළ යස   පෙමිනා"[33]

මෙම කාව්‍ය සැබවින්ම හටන් කාව්‍යයකට වඩා ප්‍රශස්ති ගණයට හා ඓතිහාසික ග්‍රන්ථයක් වශයෙන් අගය කිරීම වඩාත් උචිත වෙයි.

පරංගි හටන දෙවන රාජසිංහ රජුගේ රණශූරත්වය වර්ණනා කරමින් රචිත තවත් හටන් කාව්‍යයකි.මෙම හටන් කාව්‍යය වේවැල්දෙණියේ මොහොට්ටාලගේ රචනයක් ලෙස සැලකෙයි. දෙවන රාජසිංහ රජු කාලයේ (1629 - 1687) උඩරට රජු හා පෘතුගීසින් අතර සටන් ඇති වූ කාලයක් විය. මේ සටන් ආදිය විස්තර කර රජුට ප්‍රශස්තියක් වශයෙන් පරංගි හටන ලියා ඇත.[34] දෙවන රාජසිංහ රජු කළ වැල්ලවායේ හටන සහ ගන්නොරුව හටන මෙහි තේමාව හෙවත් වස්තු විෂය වී ඇත. ඓතිහාසික සටන් දෙකක් පිළිබඳ විග්‍රහ කිරීම කතුවරයාගේ අභිප්‍රාය වුවත් සැබෑ යුද වැනුමට එහි අවස්ථාව ලැබී ඇත්තේ ඉතා සුළු වශයෙනි. ප්‍රශස්තියට අයත් විරහ වර්ණනාදියට වැඩි අවධානයක් යොමු කර ඇත.[35]

හටන් කව්‍යයක් ලෙස ප්‍රචලිත පරංගි හටනින් ද පරංගීන් සමඟ සටන් කොට දෙවන රාජසිංහ රජු ප්‍රමුඛ සිංහල සේනා ලැබූ විජයක්ග්‍රහණය මහත් අභිමානයෙන් වර්ණනා කිරීමට උත්සහ ගනී. මායාදුන්නේ පලවාහැර අන්තෝනි හරෙන්තු අල්වා ගැනීමෙන් ජයග්‍රහණය අත්කර ගත් කොස්තන්තීනු ද සා ප්‍රමුඛ පරංගි සේනාපතිවරු ඔවුන්ගේ හැකියාවත් සම්බන්ධව ප්‍රමාණය ඉක්මවා වහසිබස් දොඩවමින් සතුටු වූහ. මේ අතර ඔවුන්ගේ තවත් පරමාර්ථයක් වූයේ කෙසේ හෝ මුළු ලංකාවේම ආධිපත්‍යය සියතට ලබා ගැනීමයි. එහෙත් දෙවන රාජසිංහ ප්‍රමුඛ

මෙරට හමුදාවන් ඌවේ රන්දෙණි වෙලේ දී කළ සටනින් සා ප්‍රමුඛ පරංගි හමුදාවට අන්ත පරාජයක් අත් විය. සිංහල හමුදාව තියුණු අසිපත්වලින් පරංගි හමුදාව කපා හෙළණු ලැබූයේ කෙසෙල් කුරුල්ලන් පෙති ගසා දමන්නාක් මෙනි.

හටනේ සෑම අවස්ථාවක්ම විස්තරලෙස දැක්වීමට ප්‍රිය කළ කවියා සතර දෙසින් කඩා වැටුණු සිංහල සේනාවට බියපත්ව දිවි ගලවා ගැනීමට හිස් ලූ ලූ අත දිව ගිය අයුරු උපහාසයෙන් යුතුව ප්‍රකාශ කරයි.

"රෝස්පාන් විස්කෝතුත් මච්චරයෙන් දෝසි හෙ ජ්පු
පාස්කු බරණිවල පිරූ අරක්තු බී වන උරු ජ්පු
දාස් ගණන් සාල් ඔලගු කෑම බීම නත් වගු ජ්පු
නාස්ති කර දමා දුවති පාගා කරමින් කුල ජ්පු"[36]

නවීන ආයුධ සහිතව යුධ බිමට පිවිසි පරංගි හමුදාව අන්තිමේ දී සිංහලයාගේ තියුණු අසිපත හමුවේ හිස් ලූ ලූ අත දිව ගියේ මුළු රටේම ආධිපත්‍ය ලබා ගැනීම පසෙකලා ජීවිතය බේරා ගැනීමේ අටියෙනි.

ක්‍රි ව : 1638 - 1658 අතර කාලයේ රචිත යැයි සැලකෙන ගන්නොරුව හටන් කාව්‍යයේ වස්තු විෂය ලෙස ගන්නොරුව හටන යොදා ගෙන ඇතත් එම හටන ගැන දීර්ඝ විස්තරයක් මෙම හටන් කාව්‍යයේ සොයා ගත නොහැක. ගන්නොරුව හටන එක් පද්‍යයකින් විස්තර කරන කවියා අනෙක් පද්‍යයන් දෙවන රාජසිංහ රජුගේ ගුණ ගායනා කිරීමට යොදා ගනියි. එබැවින් මෙම පද්‍යය හටන් කාව්‍ය නමින් රචනා කළ ද ප්‍රශස්ති කාව්‍යයක් බඳුය. එබැවින් ගන්නොරුව හටන, රාජසිංහ ස්තෝත්‍රය හෝ රාජසිංහ වර්ණනාව යන නාමයන් ගෙන් එකක් යෙදීම වඩාත් උචිතයැයි හැඟේ.[37]

ශ්‍රී වික්‍රම රාජසිංහ රජු සිංහාසනයට පැමිණ පස් වසරකට පසු ඇතිවූ සිංහල ඉංග්‍රීසි යුද්ධය වස්තු විෂය කොට ලියවෙන ඉංග්‍රීසි හටන ඓතිහාසික යුද්ධයක් වස්තු විෂය කොට ගත් සැබෑ හටන් කාව්‍යයක ස්වරූපයක් ගත් හටන් කාව්‍යකි. මුලින්



ලන්දේසීන් විසින් සියතට ගත් ප්‍රදේශ ඉංග්‍රීසින්ගේ ආධිපත්‍යයට නතු වූ කල සිරිලක බලය සියතට ගැනීමට ඔවුහු යුහුසුළු වූහ. මේ අතර පුත්තලමෙන් පැමිණි මුස්ලිම්වරුන්ගේ බඩු සත්කෝරලේ වැසියෝ කොල්ලකා ගත්හ. සිය ආධිපත්‍යය තවත් තහවුරු කර ගැනීමට සිතූ ඔවුහු මෙය අවස්ථාවක් කොට ගෙන යුද්ධය ඇරඹූහ. මේ සටන පිළිබඳ විස්තර මෙම කාව්‍යයේ සඳහන් වේ. එහිදී සිංහලයා තුළ ඉංග්‍රීසින් කෙරෙහි පැවති බලවත් අප්‍රසාදය මෙසේ ප්‍රකාශ විය.

"රටකට යුධයට මෙරඟට නොයන්න මින් මතු කලකට
පිටපට පමණින් ඉදිනට ගෙනහැර අත මිට හිගකොට
වැට බිද කෙතකට වැදසිට හොර හරකට දෙන විලසට
පිටපත බැඳගෙන වටකොට පිටපිට දෙපටින් ගුටිබැට[38]

මීට අමතරව සිංහල හමුදාව ගැන ද ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ සේවයෙහි යෙදී සිටි උඩරට රාජ්‍යයේ ප්‍රධාන නිල දරූ පිරිස ද නම් ගම් සහිතව හඳුන්වා ඇත. එමෙන්ම ඉංග්‍රීසි හටන මෙහෙයවූ නායකයින් ද මෙහි සඳහන් වේ.

හටන් කාව්‍ය ලෙස ගැනෙන ඓතිහාසික හටනක් වස්තු විෂය කරගත් කාව්‍ය පිළිබඳ අධ්‍යයනයේ දී සෑම කාව්‍යයක්ම සැබෑ හටන් කාව්‍ය ගණයට අන්තර්ගත කළ නොහැකි බව පෙනී යයි. එම කාව්‍ය අතර සැබෑ ලෙස ම සටනක් පිළිබඳ තොරතුරු අන්තර්ගතක කරමින් රචනා කෙරෙන හටන් කාව්‍ය ඇත්තේ ඉතා සුළු ප්‍රමාණයකි. හටන් නමින් හැඳින් වූ අනෙක් සියලුම කාව්‍ය හටන් කාව්‍යයන්ට වඩා හටක් කළ රජවරුන්ගේ විජයග්‍රහණයන් පිළිබඳ සඳහන් කරමින් කෙරුණු ප්‍රශස්ති ගණයට අන්තර්ගත කළ හැකි කාව්‍යයන් වේ.

## ඓතිහාසික සිදුවීම් විෂය කර ගත් හටන් කාව්‍ය

ලංකාවේ සිදුවූ ඇතැම් ඓතිහාසික සිදුවීම් මුල්කොටගෙන බිහි වූ හටන් කාව්‍ය කීපයක් හමු වෙයි. මේ හටන් කාව්‍යයන්ට වස්තු විෂය හෙවත් තේමාව වූයේ ලක්දිව කිසියම් ඓතිහාසික සිදුවීමක් හෝ ඓතිහාසික වස්තුන් පිළබඳ කතා පුවතකි. මේ

කතා පුවත් ජනප්‍රවාදයේ හෝ ජනකතා ලෙස අද දක්වාත් ජනයා අතර ශේෂව පවති. එබඳු හටන් කාව්‍ය රාශියක් සිංහල සාහිත්‍යයෙහි හඳුනාගත හැකිය.

විජය කුමරු ඇතුළු පන්සියයක් පිරිස දඹදිව සිට මෙහි පැමිණි කතා පුවත ද එබන්දකි. සිංහල ජනයාගේ ආරම්භය සිදු වුයේ ද විජය කුවේණි දෙපලගෙන් යැයි විශ්වාසයක් ජනයා අතර පවතී. විජයවිදූ හටනෙහි දක්වෙන්නේ මෙම විජය රජුගේ කතා පුවතයි. විජයිදූ හටන ඇරඹෙන්නේ විජය කුවේණි දෙදෙනාගේ පූර්ව ජන්මයේ සිටයි. පුරෝහිත බමුණකු සහ බැමිණියකව පූර්ව ජන්මයෙහි උපත ලද විජය හා කුවේණි දෙදෙනා එහිදී මහානුභාවසම්පන්න මාණික්‍ය රත්නයක් පිළබඳව ඇතිකර ගත් ආරවුලක තොරතුරු මෙහි සඳහන් වේ. පුරෝහිත බමුණාගේ යාගයකට තුටු පුඩුරු වශයෙන් මේ අගනා වස්තුව බමුණා සතු වෙවායි ප්‍රාර්ථනාවක් ඉෂ්ට කරගැනීමේ දී අපූර්ව ශක්තියකින් හෙබි මාණික්‍ය රත්නය බැමිණිය විසින් රහසි ගතව සඟවා තබා ගනු ලබයි. එහෙත් තමා විසින් එසේ නොතබන ලදැයි බැමිණිය දිවුරා  ප්‍රකාශ කළාය. දිවි හිමියෙන් අත් නොහරිමියි සරණපාවා ගත් කුවේණිය පිටුවහල් කිරීමට විජය කුමරුට සිදුවූයේ පූර්ව ජන්මයෙහි ඇයගේ බොරු දිවිරීමේ විපාක වශයෙනි. මෙහිදී විජය කුවේණි පිළිබඳ සැම තොරතුරක්ම එක්තැන් කොට සංග්‍රහ කළ කෘතියක් ලෙස ද මේ විජයිදූ හටන අගය කළ හැකිය. මෙහිදී විජය කුමරු කුවේණියගේ ද සහය ඇතිව යක්ෂ සේනාවක් වැනසූ ආකාරය නියම සටනක විලාශයෙන් ඉදිරිපත් කොට ඇත.

ලංකාදීපයේ ඉතිහාසය ඇරඹෙන එක් කඩ ඉමක් වශයෙන් රාවන රජ සමය හැඳින් විය හැකිය. මේ පසුබිම මත ලියැවුණු ඓතිහාසික සිදුවීමක් වස්තු විෂය ලෙස තබා ගත් හටන් කවකි. රාවන හටන. රාම රාවණා යුද්ධය පිළිබඳ තොරතුරු මෙහි ඇතුළත් වෙයි. රාම මිහිබට විෂ්ණු ලෙස හැඳින්වෙන මේ හටන් කාව්‍යයෙහි අනුපම වීර පුරුෂයකු ලෙස රාමා නිරූපිතය. රාමාගේ බිරිඳ වන සීතා පැහැර ගෙන ආ රාවණා තද සිත් ඇත්තකු ලෙස නිරූපණය කොට ඇත. රාමා රාවණා හටනට



හේතුවූ කරුණු කතුවරයා විග්‍රහ  කර ඇත. ඒ පුවතට අනුව රාවණා රජුගේ සොහොයුරියකවූ එක් රාක්ෂස කුමරියක් තමා විවාහ කර ගන්නා ලෙස රාමාට ආයාචනා කළාය. රාම මේ යෝජනාවට එකඟ නොවීය. රක්ෂස කුමරියගේ අවඥාවෙන් කුපිත වූ රාමා ඇගේ නාසය කැපූ බව සඳහන් වේ. එහි පළිය ගැනීමට ලංකේශ්වර රාවණා සීතාව පැහැරගෙන ගොස් ඇත. රාමාට සහාය දුන් රණශූර සෙන්පතියා වන හනුමා රජමාලිගාවට ඇතුළු වී රාමාගේ පණිවිඩය සීතාට පවසා පිටත් වූ අතර එහිදී රාජ පුරුෂයන්ගේ ඇහැනට හනුමා අසු විය. යලිත් චරපුරුෂකම්වල නොයෙදී ම සඳහා හනුමාට දුන් දඬුවම අනතුරුව මෙහි විස්තර වෙයි.

දළද වහන්සේ මුල් කර ගනිමින් ලියවුණු හටන් කාව්‍ය තවත් ඓතිහාසික හටනක් මුල් කර ගත් හටන් කවකි. සිංහල රජවරුන් දිවි දෙවෙනි කොට රැක ගත් සිංහලයාගේ ශ්‍රේෂ්ඨතම පූජනීය වස්තුව දළදාවයි. පරංගි ආගමනයේ සිට මහනුවර අවධිය දක්වා දන්ත ධාතුන් වහන්සේගේ ඉතිහාසය තේමාව කරගෙන ලියැවුණු හටන් කාව්‍යයකි දළදා හටන. ලක්දිව පරංගි ආක්‍රමණය බොහෝ අංශයන්ගෙන් මෙරටට බලපෑම් කරන්නට විය. මේ අවධියේ දළදාව රැක ගැනීමට විශාල පරිශ්‍රමයක් දැරීමට සිදුවිය. ජයවර්ධනපුර කෝට්ටේ තිබූ දළදාව ඉන් ඉවත් කිරීමට සිදුවූයේ ද මේ නිසාය. මෙහිදී කවියා පරංගීන්ගේ පැමිණීමද ඔවුන් ගෙරිසමක ප්‍රමාණයේ බිම් කඩක් රජුගෙන් ලබාගෙන වෙළදාම් කිරීම ඇරඹූ අයුරු ද කූට උපායෙන් රට අල්ලා ගැනීමට තැත් කළ අයුරුද විග්‍රහ කර ඇත.

පරසතුරු ආක්‍රමණ කොතරම් එල්ලවුව ද ඒ සැම අවස්ථාවක දී ම දිවි දෙවනි කොට මේ අනර්ඝපූජනීය වස්තුව රැකගැනීමට රජවරු උත්සුක වූහ. ආක්‍රමණිකයන්ට අසුවෙතැයි බියෙන් හිරිපිටියේ දියවඩන නිලමේ දළදාව දෙල්ගමුවේ සඟවා තැබූ අතර එතැන් සිට විමලධර්ම සූරිය රජු මහනුවර දළදා මාළිගයට වැඩමවූ අයුරු මේ දළදා හටනේ විස්තර වෙයි. මෙසේ දන්ත ධාතුන් වහන්සේ සම්බන්ධ පුරාවෘත්ත හා විමලධර්ම සූරිය රජු

පරංගීන් පැරදවීමේ හටන් තොරතුරු ද මෙහි ඇතුළත් වේ. පද්‍ය 464 කින් යුත් මේ කාව්‍ය ලියන ලද්දේ 1893 දී බව සඳහන් වේ.

ඓතිහාසික හටන් කාව්‍යයන්හි වස්තු විෂය පරික්ෂා කර බැලීමේ දී ගජබා හටන ද වැදගත් වේ. ගජබා රජු නීල නම් යෝධයා සමඟ යගදාවෙන් මුහුදු දිය දෙබෑකරමින් සොළී පුරයට ගොස් සොළී රජු බියගන්වා සිංහල දේශයට කළ අවමානයට පළිගත් ආකාරය කියැවෙන පුවතක් ගජබා හටනට විෂය වී ඇත. සොළී රජු සිංහලයන් වහලුන් ලෙස අල්ලාගෙන යන ලද්දේ කාවේරි නදියේ වේල්ලක් බැඳීම සඳහාය.

"වෙසෙස් එරජු ඉසුරෙන් සොමි අල්ලා
නිවෙස් සතුටු සිත තරම් සිය ලල්ලා
සතොස් සොළී ගඟ මෙහෙකර ලොල්ලා
දොළොස් දහස් සිර ගෙන ගියේ අල්ලා"[39]

එයට ප්‍රතිචාර ලෙස ගජබා රජු සොළී දේශයට ගොස් තවත් දොළොස් දහක් සෙනඟ ලක්දිවට රැගෙන ආ බව මෙහි කියවේ.

සිංහල රාජ්‍යයේ අවසාන කාලසීමාව තුළ පාලනයෙහි ඇති වූ පෙරළිය විස්තර කෙරෙන හටන් කවකි පෙරළි හටන. ඓතිහාසික හටන් පිළිබඳ විමර්ශනයේ දී මහනුවර යුගයේ අවසාන කාලසීමාව තුළ රාජ්‍යයේ ඇති වූ මේ පෙරළිය ද වැදගත් වේ. මේ හටනේ ප්‍රධාන තැනක් හිමිව ඇත්තේ රාජසිංහ රජුගේ අදූරදර්ශී ක්‍රියාමාර්ගය විග්‍රහ කිරීමටයි. ඒ අතර රජු විසින් ඇහැලේපොළ නිලමේගේ බිරිදට සහ දරුවන්ට දුන් අමානුෂික දඬුවම ද විස්තර කරෙයි.

ඓතිහාසික හටනක් වස්තු විෂය කරගෙන බිහිවූ හටන් කාව්‍ය වෙනුවට ඓතිහාසික හටනක් පිළිබඳ කිසිදු තොරතුරක් අන්තර්ගත නොකොට ඓතිහාසික සිදුවීමක් මුල් කර ගෙන මෙම හටන් සියල්ල රචනා වී ඇත. කෙසේ වුවත් හටන් කාව්‍ය නම් සාහිත්‍යාංගය වෙනත් අවශ්‍යතාවයන් සඳහා පසුකාලීනව භාවිත වූ අතර ඒවා නමින් පමණක් හටන් කාව්‍ය බවට පත්වී ඇත.



## සමාජ ප්‍රශ්න විෂය කරගත් හටන් කාවය

හටන් කාව්‍ය සමාජයේ ප්‍රචලිත සාහිත්‍යංගයක් බවට පත් වීමත් සමග විවිධ අවශ්‍යතා සඳහා එම කාව්‍ය සාහිත්‍ය ප්‍රවර්ගය භාවිත කළ බවට සමාජ ප්‍රශ්න විෂය කර ගත් හටන් කාව්‍ය සමූහයෙන් ද අධ්‍යයනය කළ හැකිය. සමාජ අසාධාරණතා හා සමාජ දූෂිත ක්‍රියා නො ඉවසූ අප කවීහු ඔවුනට හැකි අයුරින් ඒවා හෙළා දුටහ. සමාජ අසාධාරණතා ජනයාට හඬනගා කීමේ එක් මාධ්‍යයක් බවට ඔවූහු හටන් කාව්‍ය පත්කර ගත්හ.

අංකොට හටන එබඳු වූ හඬනැගීමක ප්‍රතිඵලයක් ලෙසින් බිහිවූ හටන් කාව්‍යකි. මෙහි තේමාව වූයේ ධනවතුන් බලවතුන් එක්ව අසරණ පීඩිතයන් පෙළන අයුරුය. සකලකලා වල්ලභ රජු මෙහි රාජ්‍ය කරන සමය සමාජ අසාධරණතා හා දූෂිත ක්‍රියාවලින් පිරි අඳුරු දුර්භාග්‍ය සම්පන්න කාලපරිච්ඡේදයක් විය. මෙකල විසූ එක් දිළිඳු තැනැත්තෙකු තම එකම සම්පත වූ අංකොට මීවකුගෙන් සී සෑම ආදී කටයුතු කරමින් දිවි රැකගත් අතර දිනක් රාජ පුරුෂයෝ පැමිණ ඔහුට තළා පෙළා මීවාද පැහැර ගෙන ගියහ. කළ හැකි අන් කිසිවක් නොවූ දුගියා යුක්තිය ඉටුකර ගැනීම පිණිස රාජ සභාවට ගියත් එහිදී ද ඔහුට පිහිටක් නොතිබුණි. දිවි රැක ගැනීමට මගක් නොවූයෙන් ඔහු සොලීකරයට පලා ගියේය. කලක් ඉතා දුකසේ එහි කල් ගෙවූ ඔහුගේ පැමිණිලිල රට වැසියාගේ මාර්ගයෙන් සෙළී රජුට සැල විය. දිළින්දාට කරන ලද අපහාසයට හා අසාධාරණයට දැඩිසේ කෝප වූ සොළී රජ බලසෙන් සහිතව මෙහි පැමිණ ලක් රජය පරාජය කළ බව ද අංකොට හටනේ සඳහන් වේ.

සමාජ අසාධාරණතා වස්තු විෂය කොටගත් හටන් කාව්‍ය අතර ඇහැලේපොළහටන ට හිමි වූයේ වැදගත් ස්ථානයකි. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු අතින් ස්වකීය අගමැති වූ ඇහැලේපොළ නිලමේගේ බිරිඳ හා දරුවන්ට සිදු කළ සහාසික අපරාධය මෙහි විස්තර වේ. එහි දී ඇහැලේපොළගේ දරුවන්ගෙන් වැඩි මහල් දරුවාගේ හිස ගසා දැමීමටත් බාල දරුවන් වනේ දා කෙටීමටත් ඇහැලේපොළ කුමාරිහාමි වැවේ ගිල්වීමටත් නියම විය.

ඇහැලේපොළ හටන ලියන ලද්දේ මේ අමානුෂික දඬුවම් නියම කළ රජු අවමානයට ලක් කිරීමට සහ මේ දඬුවම් දීම හෙළා දැකීම සඳහාය.

පෙරකදෝරු හටන සමාජ දූෂිත ක්‍රියාවන් ඉස්මතු කළ තවත් හටන් කාව්‍යකි. දුප්පත් ගැමියකුගේ නඩුවක් බාර ගත් පෙරකදෝරුවෙකු විසින් ගැමියා වංචාවෙන් රවට්ටනු ලැබූ ආකාරය හෙළි කිරීම මේ හටන් කව ලිවීමේ පරමාර්ථය වූ බව පෙනේ. තම නඩුව දිනා ගනු පිණිස දුප්පත් ගැමියාට පළමුව ධනය ද දෙවනුව දරුවන් ද පසුව සිය අඹුව ද පෙරකදෝරුවාට දීමට සිදුවූ අන්දම කතුවරයා ඉදිරිපත් කර ඇත්තේ හද කම්පා කරවන අයුරිණි.

"සිව්දෙවියනේ මට වත් මුලා
නඩුවක් අනේ මගෙ පැර දිලා
අඹුවත් අනේ දැන් නැති වෙලා
අත් ගසමින් ළෙ හි හඬලා"[40]

කාව්‍ය අවසානයේ දී නඩුව පැරදී උන් හිටි තැන් නැතිව ගිය ගැමියාට සිපිරිගෙය හිමි විය.

කොටුවැල්ලේ හටන ලියවුණේ ද එබඳුම පරමාර්ථයකිනි. කොටුවැල්ලේ කෝරල මහතා සොරුන් විසින් මරන ලද පුවත එහි විස්තර වේ. එහෙත් වරද කරුවන් කීපදෙනෙකු ක්‍රිස්තියානි ආගම වැළඳ ගැනීම නිසා නිදස් වූ පුවත එහි සඳහන් වේ. එවකට ඉංග්‍රීසි ආණ්ඩුව බෞද්ධ ජනයාට කළ වෙනස්කම් හා අසාධාරණතා මින් නිරූපණය කෙරෙයි.

1795-1797 අතර කාලයේ දී ලියවුණැයි සැලකෙන කාබෙරිහටන ලන්දේසීන් වැනසීම සඳහා ලංකාවට ගෙනෙන ලද කාබෙරි හමුදාවෙන් සිංහලයන්ට විඳින්නට සිදු වූ තාඩන පීඩන ද මහනුවර මහරජු ඔවුන් මැඩලූ අයුරු ද මෙහි සඳහන් වේ. කුපාඩිහටන සමාජ දූෂිත ක්‍රියාවන්හි නිරතවූවන්ට උපහාසාත්මකව ලියවුණු හටන් කවකි. බලුහටන බලු බද්දට විරුද්ධව මහළු බල්ලකු කරන පැමිණිල්ලක ව්‍යාජයෙන් ලියැවුනකි.



පණුහටන යනුවෙන් ලියවෙන හටන් කාව්‍ය ගොයම් පැළ විනාශ කරන පණුවර්ගයක් බෝවීම නිමිති කොට ලියවී ඇත. මෙ පණු වසංගතය ඊට පෙර ගොයමට නොවැලඳුණු රෝගයකි. එනිසා මෙයි දී කතුවරයා වී වගාව සම්බන්ධව බුද්ධ කාලයේ ශාක්‍ය හා කෝලිත වංශිකයන් අතර රෝහිණී නදියේ ජලය සම්බන්ධයෙන් ඇතිවූ ගැටුම ද විස්තර කරමින් කතා පුවත අරඹයි. ලංකාවේ නාග ගෝත්‍රික සටන අනතුරුව කවියා විස්තර කරයි. ඉන් පසු ලන්දේසි ඉංග්‍රීසි හටන් ගැන සඳහන් කරන කවියා මෙ කිසිදු අභාග්‍ය සම්පන්න කාලයක වත් සිදු නොවුන ගොයම් පණු විපතින් ගලවා දෙන ලෙස බුදුන් ප්‍රධාන දෙවිවරුන්ගෙන් ආයාචනා කර සිටියි.

සමාජ දූෂිත ක්‍රියාවන් ඉස්මතු කළ තවත් හටන් කාව්‍යකි සූදුහටන. කලක් තිස්සේ පොලීසියේ ද ඇස් වසමින් නෙයිනා නැමැති පුද්ගලයකු පවත්වාගෙන යනු ලැබූ සූදු පොලක්වැටලීම මේ හටන් කවේ විස්තර වශයෙන් දක්වා ඇත. සූක්ෂම අයුරින් වැටලීම කරනු ලැබූයේ ජෝන් කොතලාවල මහතා විසිනි.

සමාජ අසාධාරණතා හා දූෂිත ක්‍රියාවන්ගෙන් පීඩාවට පත් වූයේ මහජනතාවයි. එහෙත් අවස්ථාව ලද විට ඔවුහු සිය විරෝධය පල කිරීමට ද පසුබට නොවූහ. කොහුකොරටු හටන ට වස්තු විෂය වූයේ එබඳු පුවතකි. කොහු වලවල්වලට බදු පැණවීමත් බදු නොගෙවීම නිසා වලවල් වැසීමටත් එකල විසූ මුලාදෑනිවරු යුහුසුලු වූහ. මෙසේ ඔවුන් කතලුව ගම්මානයට ද පැමිණි අතර එහිදී පොල්ලෙලි තළමින් සිටි ගැමි ගැහැණුන්ගේ ඉලිපත් පහරින් සංග්‍රහයක් ද විඳ ආපසු ගිය අන්දම හාස්‍යයෙන් හා උපහාසයෙන් යුතුව විස්තර කර ඇත.

මෙම හටන් කාව්‍ය සමූහයෙන් විවිධ සමාජ ප්‍රශ්නවලින් පීඩාවට පත් වූ ජනයා සමාජය දැනුවත් කිරීමටත් ඒ සඳහා විසඳුම් සොයාගැනීමටත් ප්‍රබල මාධ්‍යයක් ලෙස හටන් කවිය භාවිත කර ඇත. සමාජ ප්‍රශ්න මුල්කර ගත් හටන් කාව්‍ය තුළ විශේෂ ලක්ෂණයක් ලෙස උපහාසය හා හාස්‍ය අධ්‍යයනය කළ හැකිය. කෙසේ වුවත් හටන් යන නාමය මේ කාව්‍යවලට භාවිත කළත්

කිසිදු ඓතිහාසික හටනක් පිළිබඳ තොරතුරු මෙහි අන්තර්ගත නොවේ.

## පෞද්ගලික ප්‍රශ්න විෂය කර ගත් හටන් කාව්‍ය

හටන් කාව්‍යයේ පසුකාලීනව හඳුනාගත හැකි තවත් විශේෂ ලක්ෂණයක් ලෙස පෞද්ගලික ප්‍රශ්නවලට මුල්තැන දී රචනා කෙරෙන හටන් කාව්‍ය හඳුනා ගත හැකිය. මෙම කාව්‍යයන්හි ද ඓතිහාසික හටන් වස්තු විෂය වී නොමැත. පෞද්ගලික ප්‍රශ්න මුල්කරගත් හටන් කාව්‍යයන්හි  පුද්ගලයන්ට බලපෑ විවිධ ප්‍රශ්න හා පෞද්ගලිකව ඔවුන් විඳි අතවරයන් දුක් ගැහැට ප්‍රකාශ කිරීමේ මාධ්‍යයක් බවට හටන් කාව්‍ය යොදා ගෙන ඇත. මේ අරමුණින් ලියවුණු හටන් කාව්‍ය කීපයක් හඳුනා ගත හැකිය.

- තරව් හටන.
- මරක්කල හටන
- සහබන්දු හටන
- දුවිලි හටන
- කනවැන්දුම් හටන
- ගුරු හටන
- මග හටන
- අරාබි හටන
- ඇටිකුකුල් හටන
- වෛතුල්‍ය හටන
- සීහල බස් හටන

මෙම හටන් කාව්‍යයන්හි නාමය දෙස අවධානය යොමු කරන විට ඒවායේ ස්වභාවය පිළිබඳ යම් අවබෝධයක් ලබා ගැනීම පහසු වේ. පෞද්ගලික ප්‍රශ්න මුල් කරගෙන රචනා වන හටන් කාව්‍යයන්හි නාමය යොදා ඇත්තේ එම ගැටලුවේ ස්වභාවය අනුවය.

තරව් හටන භික්ෂූන් වහන්සේ නමක් පෞද්ගලිකව මුහුණ දුන් ගැටලුවක් මුල් කරගෙන රචිත පද්‍යයකි. කණ්ණාඩි කුට්ටමක් මිලදී ගැනීම සඳහා උඩරටින් කොළඹට වැඩි භික්ෂූන් වහන්සේ



නමකට තරව් කරුවන් එකතු වී වීදුරු නැති කණ්ණාඩියක් ලබා දීම මුල් කර ගෙන තැරුව් හටන ලියවෙයි. එම ක්‍රියාව කළ වුන්ට ශාප කරීම කවියා සිදු කරයි.

මරක්කල හටන එබඳු තවත් කාව්‍යයකි. කවියා තේමා කර ගෙන ඇත්තේ සිංහල වඩු තරුණයකු මරක්කල තරුණියක සමඟ රහසිගතව පලායාමේ සිද්ධිකි. දෙපිරිසක් අතර මහත් ගැටුමකට තුඩුදුන් මේ සිද්ධිය කවි 72 කින් මරක්කල හටනේ විස්තර කෙරෙයි. සහබන්දු හටන සහ දුවිලි හටන ශෘංගාරාත්මක හටන් කාව්‍යද්වයකි. දුනුවිල හටනේ මවක හා දියණියක අතරේ ඇති වූ සංවාදාත්මක ස්වරූපයකින් කතා පුවත ඉදිරිපත් කෙරෙයි. දියණිය අනාචාරයේ හැසිරී ඇති බව ඇගේ සිරුරේ බාහිර ලක්ෂණ පිරික්සීමෙන් මව ප්‍රකාශ කළත් දියණිය සූක්ෂම ලෙස පිළිතුරුදෙමින් තමා එසේ අනාචාරයේ නොහැසිරුණු බව ප්‍රකාශ කරයි. අන්තිමේ දී ඇය අනාචාරයේ හැසිර ඇත්තේ දුනුවිල නිලමේ සමඟ බව දැනගත් මව සතුටුවෙයි. තමන්ට අහිමි වූ ගම ලබා ගැනීමට එමඟින ඈ සමත් වෙයි. කනවැන්දුම්හටන ලියවී ඇත්තේ ද එබඳුම පෞද්ගලික ප්‍රශනයක් කියා පෑමේ අටියෙනි. හිමියා මළ ස්ත්‍රීන් දෙදෙනෙකු වෙසෙන අතර ඔවුන්ගෙන් එක් තැනැත්තියක දුසිරිතේ ඇලී ගැලී සිටින අතර අනිත් තැනැත්තිය සුචරිතයේ පිහිටා ජීවත් වෙයි. එම චරිත දෙක මුල් කරගෙන කනවැන්දුම් හටන රචානා වෙයි.

ගුරුහටන නම් හටන් කාව්‍ය ලියවී ඇත්තේ උඩරට ප්‍රදේශවල ප්‍රචලිතව පවතින සොකරි කතාව ඇසුරණි. දිල්ලියේ විසූ ආඩි ගුරෙක් ස්වකීය බිරිඳ හා මෙහෙකරුවා සමඟ ජීවත් වීමේ මාර්ගයක් හොයා නැවකින් මෙරටට සේන්දු වෙයි. එහිදී තඹරාවිට ගමේ වෙදරාළ සමඟ ගුරුගේ බිරිද සොකරි පලාය යි. ගුරු හටන මේ පුවත වස්තු විෂය කොට ගත් හටන් කාව්‍යකි. මීට අමතරව ගමයකුගේ මෝඩකම් ගැන ප්‍රකාශ කිරීමට මග හටන ද උපසම්පදා විනය කර්මයක් පිළිබඳ භික්ෂූන් වහන්සේලා අතර ඇති වූ මතභේදයක් මුල්කොට ගෙන දල්හිකටී හටන ද අරාබිපාෂා නමැති ජන නායකයා මෙරටට පටුවහල් කිරීම මුල්

කරගෙන අරාබි හටන ද පෞද්ගලික ප්‍රශ්න විෂය කර ගත් හටන් කාව්‍ය ලෙස හඳුනා ගත හැකිය.

පෞද්ගලික ප්‍රශ්න විෂය කරගත් හටන් කව්‍ය මගින් මිනිසුන් අතර ඇති වූ ප්‍රශ්න සම්බන්ධව පමණක් නොව සතුන් අතර ඇතිවූ ප්‍රශ්න ද හටන් කාව්‍යයන්ට වස්තු විෂය කර ගෙන ඇත. ඇටිකුකුල් හටන එබඳු කාව්‍යයකි. ඇටිකිකිළිය මොනරා කෙරෙහි පැහැදී මොනරාගේ රුව වර්ණනා කරයි. මෙයින් මහත් සේ කිපෙන අටිකුකුළා කිකිළිය කෙරෙහි විශ්වාසයක් නැති බව පවසමින් මොනරාට ද බැන වැදෙයි. එහෙත් අන්තිමේ දී තම දස්කම් දැක්වීමට ඇටිකුකුළා නටයි. ඇටිකිකිළිය ඉන් පැහැදී දොළොස් මස අතුරින් මැදින් මස මංගල්‍යයට යොග්‍ය වබ තීරණය කරයි. මෙම පුවත හටන් කවට වස්තු විෂය වේ.

පද්‍යයට පමණක් සීමා නොවී පසුකාලීනව ගද්‍යයෙන් ද හටන් කාව්‍ය ලියවී ඇති බව අධ්‍යයනය කළ හැකිය. ක්‍රි. ව. 1889 දී ලියවුණු වෛතුල්‍ය හටන සහ සීහල බස් හටන එබඳු හටන් කාව්‍ය දෙකකි. වෛතුල්‍ය හටනින් දැනට ලංකාවේ ගම් නියම්ගම් රාජධානි ආදී නොයෙක් තන්හි ගිහි පැවිදි සමූහයා අතරේ පවත්නා සියලු අධර්ම වාදවලට දේශනා පෙළ අටුවා ටීකා ප්‍රකරණ ආදියෙන් දිය යුතු නියම උත්තර සියල්ල මෙහි අන්තර් ගත කොට ඇත. සිංහලය මෙරට රාජ්‍ය භාෂාව බවට පත්කිරීම යුක්ති සහගත බව පෙන්වා දීමට සීහල බස් හටන රචනා වෙයි. 1959 දී පළ වූ මෙම හටන් කාව්‍යයේ කතුවරයා පී. බී. බාලසූරිය නැමැත්තෙකි.

පෞද්ගලික ප්‍රශ්නයක් මුල් කරගත් මෙබඳු හටන් කාව්‍ය රචනා වූයේ පැවති කිසියම් සටනක් අරභයා හෝ වෙනත් පරමාර්ථයකින් නොව හුදෙක් සමාජ සංශෝධන කාර්යයන් උදෙසා බව පැහැදිලිය. ඒ අනුව පසුකාලීනව වනවිට හටන් කාව්‍යයේ මුඛ්‍ය පරමාර්ථය සහමුලින්ම වෙනස්වන අයුරු හටන් කාව්‍ය මගින් අධ්‍යයන කළ හැකිය.

සීතාවක අවදියෙන් ආරම්භ වූ හටන් කාව්‍ය හෙවත් හටන නමින් යොදගත් කාව්‍ය මහනුවර යුගයේ නව සාහිත්‍යාංගයක්



ලෙස ජනයා අතර ඉතාමත් ජනප්‍රිය වූ බව පැහැදිලිය. සිංහල සාහිත්‍යයේ එතෙක් මෙතෙක් බිහිව ඇති හටන් කාව්‍ය දෙස බැලීමේ දී ඉතා විශාල සංඛ්‍යාවක් හමුවන බව කිවයුතු අතර එහි අන්තර්ගත කරුණු අනුව යුද්ධ හෙවත් හටන, ප්‍රවෘත්තිය, ඓතිහාසික තොරතුරු, සමාජ ප්‍රශ්න, ශෘංගාරය, උපහාසය හා පෞද්ගලික ප්‍රශ්න ආදී විවිධ තේමාවන්ට මුල්තැන දෙමින් රචනා කර ඇත.

මුල්කාලීන හටන් කාව්‍ය සටනක් මුල්කරගනිමින් රචනා කිරීම මූලික ලක්ෂණය විය. නමුත් හටන් කාව්‍යයේ පසුකාලීන ව්‍යාප්තිය දෙස බැලීමේ දී හටන් නමින් හැඳින්වූ කාව්‍ය සීග්‍රයෙන් ප්‍රචලිතව ගිය ද එම කාව්‍යයන් මඟින් පැවති යුද්ධයක් හෝ සටනක් අරමුණු කොට ලියවුණු කිව්‍යයන් නොවන බව අධ්‍යයනය කළ හැකිය. නාම මාත්‍රිකව පමණක් හටන් කාව්‍ය වූ පසුකාලීනව හටන් නමින් සිංහල පද්‍ය සාහිත්‍යට එක්වූ බොහෝ පද්‍ය කාව්‍යයන් විවිධ ඓතිහාසික සිදුවීම්, සමාජප්‍රශ්න හා පෞද්ගලික ප්‍රශ්න කියාපෑමේ මාධ්‍යයක් බවට පත්ව ඇති බව පැහැදිලිය. ඒ අනුව සිංහල සිහිත්‍යයේ විශේෂ අංගයක් ලෙස සලකන හටන් කාව්‍යවල වස්තු විෂය පිළිබඳ අවධානය යොමු කරමින් සිදු කළ යථෝක්ත විමර්ශනය දී පැහැදිලි වන්නේ කිසියම් ඓතිහාසික යුද්ධයක් හෙවත් සටනක් වස්තු විෂය කරගත් කාව්‍ය බිහිවී ඇත්තේ අතලොස්සක් බවය.කෙසේ වුවත් ආරම්භක හටන් කාව්‍යයන්හි මෙන්ම මහනුවර යුගයේ ලියවුණු පසුකාලීන හටන් කාව්‍යවල ද බොහෝ ඓතිහාසික කොරතුරු අන්තරගතව ඇත. එබැවින් ඉතිහාසය හදරන්නෙකුට වංශකථා හා රාජාවලී පොත් මෙන් ම හටන් කාව්‍යයන් ද අගනා මූලාශ්‍ර වේ.

## ආන්තික සටහන්

1. කොත්මලේ අමරවංශ හිමි, සිංහල සාහිත්‍යලතා, කොළඹ 10: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, 2000, පිටුව 12.
2. පුංචිබණ්ඩාර සන්නස්ගල(සං), සිංහල ප්‍රශස්ති හා හටන් කාව්‍ය, කොළඹ: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 1999, පිටුව57.
3. එම, පිටුව 14.
4. එම, පිටුව 195.
5. එම, පිටුව 181.
6. කේ. එච්. ද සිල්වා, සිංහල හටන් කවි, කොළඹ: ලංකා ප්‍රකාශන, 1964. පිටුව 29.
7. අඹගස්පිටියේ විමල හිමි, සිංහල හටන්කවි සාහිත්‍ය විමර්ශන, කොළඹ 10: ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ, 1998, පිටුව 71.
8. හේන්පිටගෙදර ඥානසීහ හිමි, සියස්ලකර විස්තර වර්ණනාව, කොළඹ 10: එස්. කේ. චන්ද්‍රසේන සහ පුත්‍රයෝ, 1964, පිටුව 15.
9. කෝන්ගස්තැන්නේ ආනන්ද හිමි, මුවදෙව්දවත සන්නය, රත්නපුර: කර්තෘ ප්‍රකාශන, 1997, පිටු 28, 29.
10. කොදගොඩ ඥානාලොක හිමි, සිදත්සඟරා පුරාණ සන්නය, වැලිගම, හේමචන්ද්‍ර වී. ගුණසේකර, 1971, පිටුව 105.
11. එම, පිටුව 251.
12. ඇම්. බී. ආරියපාල, කව්සිළුමිණ, කොළඹ 10, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 1994, පිටුව 392.
13. එම, පිටුව400.
14. කුමාරතුංග මුනිදසල, ගිරා සන්දේශ විවරණය, කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 1994, පිටු 193-194.
15. එම, පිටු 83-91.
16. පුංචිබණ්ඩාර සන්නස්ගල(සං), එම, 1999, පිටුව 169.
17. එම, පිටුව 57.
18. සිරි තිලකසිර (සං), පැරකුම්බා සිරිත, කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2003, පිටු 7,10.
19. සිරි තිලකසිර (සං), විල්ගම්මුළ තෙරිඳුන් කළ සඳකිඳුරු දකව, කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2005, පිටු 10,18.
20. කේ. එච්. සිල්පුවා, සිංහල හටන් කවි, කොළඹ: ලංකා ප්‍රකාශන, 1964, පිටුව 21.



21. අසව් ඉසි සැබි හෙළ, සියබස්ලකර, කොළඹ: ගුණසේන සහ සමාගම, 1963, පිටුව 20.
22. පුංචිබණ්ඩාර සන්නස්ගල(සං), එම, 1999, පිටුව 14.
23. ඔක්කම්පිටියේ පඤ්ඤාසාර හිමි, සුමනප්‍රභා, නුගේගොඩ, කොලිටි ප්‍රින්ටර්ස්, 2007, පිටුව,113.
24. එම, පිටුව 14.
25. අඹගස්පිටියේ විමල හිමි, එම, 1998, පිටුව 84.
26. එම, පිටුව 84.
27. මාර්ටින් වික්‍රමසිංහ, සිංහල සාහිත්‍යයේ නැගීම, දෙහිවල: සීමා සහිත තිසර ප්‍රකාශකයෝ, 1997, පිටුව 246.
28. ඇඩ්වින් රනවක (සං), කුස්තන්තීනු හටන, කොළඹ: ගුණසේන සහ සමාගම, 1938, පිටුව 23.
29. පුංචිබණ්ඩාර සන්නස්ගල, සිංහල සාහිත්‍ය වංශය, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2013, පිටව 30.
30. අඹගස්පිටියේ විමල හිමි, එම ,1998, පිටුව 118.
31. පුංචිබණ්ඩාර සන්නස්ගල(සං), එම, 1999, පිටුව 277.
32. එම, පිටුව 197.
33. අඹගස්පිටියේ විමල හිමි, එම, 1998, පිටුව 124.
34. පුංචිබණ්ඩාර සන්නස්ගල(සං), එම, 1999, පිටුව 307.
35. එම, 1999, පිටුව 186.
36. පුංචිබණ්ඩාර සන්නස්ගල, සිංහල හටන් කාව්‍යයන්ගේ ප්‍රභවය හා විකාශනය, කොළඹ: සංස්කෘතික දෙපාර්තමේන්තුව, 1966, පිටුව 47.
37. අඹගස්පිටියේ විමල හිමි, එම ,1998, පිටුව 109.
38. සරත්ලයනල්, ඉංග්‍රීසි හටන, කොළඹ: ඇස් ගොඩගේ සහ සමාගම, 2001, පිටුව 163.
39. කේ. එච්. සිල්වා, සිංහල හටන් කවි, කොළඹ: ලංකා ප්‍රකාශන, 1964, පිටුව 169.
40. පුංචිබණ්ඩාර සන්නස්ගල, එම, 1966, පිටුව 21.